# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2003 අංක 31 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 ඔක්තෝබර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2003 ඔක්තෝබර් මස 23 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි

# 2003 අංක 31 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 ඔක්තෝබර් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 48/2003.

## 2003 අංක 10 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2003 අංක 31 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 10 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2003 අංක 10 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "2003 ජූනි මස 30 වන දින දී හෝ ඊට ප්‍රථම කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රකාශයක් කරනු ලැබිය හැකිය" යන වචන වෙනුවට "2003 අගෝස්තු මස 31 වන දින හෝ ඊට ප්‍රථම කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ අතුරු විධානයේ "2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කරනු ලැබිය හැකි අතර" යන වචන වෙනුවට "2003 අගෝස්තු මස 31 වන දින හෝ ඊට ප්‍රථම ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය. ඒ ප්‍රකාශය 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයක් ලෙස සැලකිය යුතු අතර" යන වචන ආදේශ කිරීමෙන්.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ, එහි (2) වන උපවගන්තියේ අතුරු විධානයේ "මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත" යන වචන වෙනුවට "2003 අගෝස්තු මස 31 වන දින හෝ ඊට ප්‍රථම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—H 19143—5,600 (2003/07)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.